



# A Baby in Parliament Session

## පාර්ලිමේන්තුව තුළට අතදරුවෙකු ගෙන එයි

**Member of European Parliament Took Her Baby to Work**

A member of European Parliament Licia Ronzulli took her 1-month-old baby to the Parliament session in Strasbourg. She wanted to make a point about the difficulties women face in trying to juggle careers and child care.

යුරෝපීය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක වන මේ කාන්තාව මසක් වයසැති තම බිළිඳදා ද රැගෙන පාර්ලිමේන්තුව තුළට සැසිවාරය සඳහා මෙසේ පැමිණියේ කාන්තාවන්ට දරුවන් බලාකියා ගැන්මත් රැකියාවත් එකට කිරීම අපහසු බව ක්‍රියාවෙන්ම පෙන්වීම සඳහාය.



## විවාහ වූ සැමියා කාන්තාවක් බව පසුව හෙළිවේ

23 හැවිරිදි තරුණියක් විවාහ වී අවුරුද්දක් පමණ දීගෙ කෑ තම සැමියා පිරිමියෙකු නොව ගැහැණියක බව දැකීමෙන් වූ ඉමහත් කම්පනය කොතෙක්ද යත් ඇය සිහිසන් නැතිව ඇද වැටුණු බව කියති. සැමියා පිළබඳ රහස හෙළි වුණේ දිනක් ඔහු බීමත්ව ගෙදර පැමිණි දිනය. ඔහු ඇඳ සිටි සරම බිරිඳ ඉදිරිපිටදීම බිමට කඩා වැටුණු විට රහස එළියට ආවේය.

සැමියා දික්වැල්ල ප්‍රදේශයේය. බිරිඳ ගන්දර පොලීසියට ගොස් සිද්ධිය පැමිණිලි කළ පසු පොලීසිය ගොස් සෙවූ විට සැමියා ලෙස පෙනී සිටියාය කියන කාන්තාව පැන ගොස් තිබුණේය. එසේම සැකකාර කාන්තාව තමා හමුදා භටයෙකු බව ද තරුණියට කියා තිබුණි. ඇයට දී තිබුණු හමුදා ඡයාරූපය බොරු එකක් බව හෙළිවිය. පුදුමය නම් මාස දහයක් යන තුරු තරුණිය මේ කිසිවක් නොදැන සිටීමය. මේ කාරණය මත විවාහය ඉබේම අවලංගු වන බව පොලීසිය පවසයි.

## රේඩියෝව අහනවට සල්ලි දෙන රටක්

රේඩියෝව වැදගත්ම සන්නිවේදන මාධ්‍යයක් යයි පුන පුනා කිව්වද විහිළු කතා හෝ බොළඳ ගීත අසන්නන් මිස ගුවන් විදුලියෙන් හරවත් ප්‍රයෝජනයක් ලබන්නන් ඉතා විරලය.

තිබෙන නාලිකා අතර නිරර්ථක තරගය කෙතරම් පහළ මාර්කටින් උපායන්ට ගොදුරු වී තිබෙන්නේද යත් තමන් අසන්නේ අසවල් නාලිකාව යයි බෝඩ් කෑලිවල ලියා ඒවා තම නිවසේ හෝ කඩයේ එල්ලාගෙන සිටින්නනට තෑගි දෙන සිනහ උපදවන තරගද දන් දන් පැවැත්වේ.






# Keeper තබාගන්නා

Their marriage was good, their dreams focused. Their best friends lived barely a wave away. I can see them now, Dad in trousers, work shirt and a hat; and Mom in a house dress, lawn mower in one hand, and dish-towel in the other.

It was the time for fixing things: a curtain rod, the kitchen radio, screen door, the oven door, the hem in a dress. Things we keep.

It was a way of life, and sometimes it made me crazy. All that re-fixing, re-heating leftovers, renewing; I wanted just once to be wasteful. Waste meant affluence. Throwing things away meant you knew there'd always be more.

But when my mother died, and I was standing in that clear morning light in the warmth of the hospital room, I was struck with the pain of learning that sometimes there isn't any more.

Sometimes, what we care about most gets all used up and goes away...never to return. So... While we have it, it's best we love it... And care for it... And fix it when it's broken... And heal it when it's sick.

This is true: For marriage... And old cars... And children with bad report cards... Dogs and cats with bad hips... And aging parents... And grandparents. We keep them because they are worth it, because we are worth it. Some things we keep, like a best friend that moved away or a classmate we grew up with.

There are just some things that make life important, like people we know who are special... And so, we keep them close!

ඔවුන්ගේ විවාහය ඉතා යහපත් විය. සියළු බලාපොරොත්තු ඉටුවූ සෙයකි. ඔවුන්ගේ හොඳම යහළුවන් සිටියේද හඬ නගා කතා කළොත් ඇසන තරම් දුරිනි. මට මේ දෙදෙනා දැන් මැවී පෙනේ. කලිසමකින් කමීසයකින් සැරසී හිස්වැස්මක් පැළඳි මපියාණන් කිසියම් වැඩක නිරතව සිටියි.

මෑණියන් සාමාන්‍ය ගෘහණියක ලෙස සැරසී පිහන් කෝප්ප සෝදා රෙදිකඩකින් පිසදමමින් පිරිසිදු කරන්නීය. කැඩුණු, බිඳුණු, ඉරුණු ඒවා ඔවුන් පිළිසකර කරනු මට නිතර පෙනේ. ඉරුණු තිර රෙද්දක් මසමින් හෝ දොරක කැඩුණු අගුල සාදමින් හෝ උදුණේ හෝ ශීතකරණයේ හෝ නොවැසෙන දොරක් යථා තත්වයට පමුණුවමින් හෝ මේ ආදී කැඩුම් බිඳුම් ඉරීම් ආදිය යථා තත්වයට පත්කිරීමට මා දෙමාපියෝ වෙහෙසක් ගනිති.

එවැනි දේ ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතය වුවද මට නම් එය මහා විකාරයකි. සමහර දාට පරණ කෑම රත්කර ගනිති. පරණ ඇඳුම් විසි නොකොට මසා අණ්ඩ දමා යළි අඳින්ට ගනිති. මපියාණෝ පරණ රේඩියෝව කැඩෙන වාරයක් පාසා අළුත් වැඩියාකරන්නට වෙහෙසක් ගනිති. ටික දිනක් එය ක්‍රියා කර යළිත් නවතී. බිත්තියේ ගැසූ බට්ටා ඔර්ලෝසුවද එසේමය. මේ පුන පුනා පිළියම් කිරීම නවතා අළුතින් යමක් ගන්නේ නැද්ද? මට මේ සියල්ල දැන් ඇතිවෙලාය. මට අවශ්‍ය වූයේ ඉඳ හිට හෝ අළුතින් යමක් ගෙදරට ගන්නවා දකින්නටය. එවිට පරණ ඒවා විසිකර දමනු හැකිය.

යම් තරමකට නාස්ති කිරීමද කළ යුතුයයි මම සිතමි. නාස්ති කරන්නේ යමක් කමක් ඇති පෙහොසත් උදවියයි. සකසුරුවමේ එවැනි දෙයක් නැත. නාස්තිකිරීම එක්තරා විදියකට පොහොසත් කමේ ලක්ෂණයකි. එවැනි ජීවිතයක් ගතකරන්නට මට උවමනාය. යමක් විසිකර දමන විට ඒ තැන ගන්නට අළුත් දේවල් එමට තිබේ.

එහෙත් එක්තරා දවසක උදෑසන පතිත ලා හිරු රැස් උණුසුම දැවටුණු රෝහලේ වාට්ටුවක ඇඳේ මගේ මෑණියන් ගේ අවසන් මොහොත සිදුවූ කල උපන් දැඩි ශෝකය තුළින් මට හදිසියේම අවබෝධ වූයේ ඒ තැන ගන්නට කිසිදු අළුත් දෙයකට නොහැකි බවයි.

සමහර විට අප බොහෝ අගය කරන දේවල් ඒ එහි ඇති ප්‍රයෝජනය ක්‍රමයෙන් නිම වෙමින් නැවත නොඑන්නටම යන්නටම යයි. එබැවින් ඒවා අප ළඟ තිබෙන විට හැකි පමණ අගේ කළ යුතුය. රැක බලා ගත යුතුය කැඩුණොත් වහා පිළියම් කරගත යුතුය. අසනීප වුවහොත් සුව කර ගත යුතුය.

බොහෝ දේ සම්බන්ධයෙන් මේ කරුණු සැබෑය. විවාහයන්, පරණ මෝටර් රථ, ඇතිකරන සතුන්ගේ ආබාධයට ලක් වුණු පාද හන්දි ආදිය හෝ වයසට යන දෙමාපියන්. සීයලා ආත්තම්මලා මේ සියළු දේ නැවත නැවත පිළියම් කර යථා තත්වයට පත්කර ගන්නට මහන්සි ගත යුතුය. පරෙස්සම් කරගත යුතුය. මක්නිසාද යත් එසේ කරන්නට ඒවා වටිනා දේවල් බැවිනි. කොපමණ පරණ වුනත් සමහර දේ අපට විසිකර දමන්නට බැරිය. ඒවායින් තොරවූ කල ජීවිතය සැබැවින්ම හිස් බව දැනේ. එය වැටහෙන්නේ ඒ දේවල් නැතිවී ගිය කලය. එසේ නොවන්නට නම් ඒ දේවල් අගය කරන්නට අප පුරුදු විය යුතුය.

මා මේ කී දේවල් විකාරයක් ලෙස සිතා ඔබ සමහර විට ඉවත දමන්නට පුළුවන. ඒ ගැන මම උරණ නොවෙමි. පිළිගැනීම හෝ නොපිළිගැනීම ඔබ සතුය. මට හිතුන දෙය මම ඔබට කීවෙමි.

♦ දීපා සඳමාලි හේරත්
**Deepa Sandamali Herath**
**USA**

**This message is for Madhava Gangodawila in London. Please contact Vasantha Jayasuriya in Sri Lanka. His phone numbers are: 0094-777-724354 / 0094-777-005466 & 0094-11-2525902**